# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 මාර්තු මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.03.29 දින නිකුත් කරන ලදී)

## අල්ලස් (සංශෝධන)

**(26 වන අධිකාරය වූ) අල්ලස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහාධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු ගොනුකිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමයි.

# අල්ලස් (සංශෝධන)

එල්. ඩී.— ඕ. 3/2018.

**(26 වන අධිකාරය වූ) අල්ලස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක දරන අල්ලස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

26 වන අධිකාරයේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ 70 වන වගන්තියේ "මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.